# 1993 අංක 03 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.

# THE WESTERN PROVINCE PROVINCIL ROAD PASSENGER CARRIAGE SERVICE

# STATUTE NO; 03 OF 1993

1992 අංක 01 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

1. මේ ප්‍රඥප්තිය 1993 අංක 03 දරණ බස්නාහිර පළාතේ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. මෙහි මින් මතු , ''ප්‍රධාන ප්‍රඥප්තිය'' , යනුවෙන් සඳහන්කරනු ලබන 1992 අංක 01 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 03 වන වගන්තියේ (01) වන උපවගන්තියේ (අ) ජේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ජේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1992 අංක 01 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 03 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) මෙහි මින් මතු, "පත්කළ සාමාජිකයන්", යනුවෙන් සඳහන් කරනු ලබන සාමාජිකයන් සත්දෙනෙකුගෙන් තව ද ඔවුන් අතුරෙන්

(I) තිදෙනෙකු මාර්ගස්ථ මගී ප්‍රවාහනය, වානිජ්‍යය, මූල්‍යකරණය සහ පරිපාලනය යන ක්ෂේත්‍රවල පුළුල් පළපුරුද්දක් සහ ප්‍රකට හැකියාවක් ඇතැයි පළාත් සභා අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරෙන් පළාත් සභා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් විය යුතුය.

(II) එක් තැනැත්තකු පළාත් සභා අමාත්‍යවරයා විසින් පොලිස් දෙපාර්තමේන්තුවෙන් පත් කරනු ලබන තැනැත්තා

විය යුතුය.

(III) එක් තැනැත්තකු පුද්ගලික බස් රථ හිමියන් අතුරෙන් .මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශය මත පළාත් සභා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තකු විය යුතුය. තව ද,

(IV) දෙදෙනකු බස් මගින් අතුරෙන් තෝරා ප්‍රවාහන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශය මත පළාත් සභා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් විය යුතුය. ,

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ , ''බස් රථයක්'' , යන වචන වෙනුවට, ''බස් රථයක් හෝ බලයලත් වාහනයක් '', යන වචන ආදේශ කිරීමෙන් ත සහ

(ආ) ඒ වගන්තියේ (3) උපවගන්තියේ , ''බස් රථයක්'' , යන වචන වෙනුවට, , ''බස් රථයක් හෝ බලයලත් වාහනයක් '', යන වචන ආදේශ කිරීමෙන්.

4. 34 වන වගන්තියට ඉක්බිතිව, පහත දැක්වෙන අළුත් වගන්තිය ඇතුලත් කරනු ලැබිය යුතු අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 34 අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුයඃ- ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියට ඉකිබිතිවම 34 අ අළුත් වගන්තියක් ඇතුලත් කිරීම.

34 අ (1) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ පාවිච්චි කරනු ලබන යම් බස්රථයක :- ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීම පැහැර හැරීම.

(අ) කොන්දොස්තරවරයෙකුගෙන් ගමන සඳහා ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ-

(ආ) ගමන සඳහා ප්‍රවේග පත්‍රයක් ලබාගෙන, ගමනේ අවසානය දක්වා එය ළඟ තබා නොගන්නා හෝ-

ඒ බස් රථයේ කොන්දොස්තරවරයා විසින් හෝ පළාත් අධිකාරියේ බලයලත් යම් නිළධරයකු විසින් යම් ප්‍රවේශ පත්‍රයක් පෙන්විය යුතු යයි භාරදිය යුතු යයි ඉල්ලා සිටි විට, එසේ කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන

ඒ බස් රථයේ යම් මගියෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙසීයකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(2) (1) වන උපවගන්තියේ විධි විධානවල කුමක් සඳහන් ඇත ද, යම් මගියකු විසින් පළාත් අධිකාරියේ බලය ලත් යම් නිළධාරයකු වෙත රුපියල් සියයක දඩයක් සහ ඒ ගමන සඳහා තමාගෙන් අයවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් ගෙවනු ලබන්නේ නම්, ඒ මගියාට විරුද්ධ ඒ උපවගන්තිය යටතේ වූ

වරදක් සම්බන්ධයෙන් කිසිම නඩුවක් හෝ පවත්වාගෙන යාම කළ නොහැකිය.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ "පළාත් සභා අමාත්‍යවරයා" යන යෙදුමෙහි අර්ථ නිරූපණයට පෙරාතුවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "බලයලත් වාහනය'' , යන්නෙන් , ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් මත මගින් ගෙනයාම පිණිස පළාත තුළ ආරම්භ කැරෙන නිතිපතා සේවයක් සඳහා භාවිතා කරනු ලබන කවර වුව ද වාහනයක් අදහස් වේ."

6. ප්‍රධාන ප්‍රඥප්තියේ "බස් රථය" සහ "බස් රථ" වන වචන යෙදී ඇති කවර තැනක වුව ද ඒ වචන වෙනුවට පිළිවෙලින් "බස් රථය හෝ "බලයලත් වාහනය"සහ "බස් රථ හෝ බලයලත් වාහන" යන වචන ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට වෙනත් සංශෝධන

7. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.